**සඥාපනය**

කුඩා දරුවනට අකුරු කියවන පාඩම් පොත් පෙළේ දෙවැන්න නම් පොත ය. හෝඩිය කියැවූ පසු අකුරු කිහිපයක් එක් කොට තැනූ වචන කියැවීම හුරු කරනු පිණි මෙය පැරැණි පන්සල් පාසල් හි භාවිත විය. මෙය මුලදී රචිතව ඇත්තේ සති පිරිත් අවසනැ ආටානාටිය දේශනාවට මුලින් කියන විහාර අස්න වශයෙනි. මෙය හවන පැරකුම්බා රජ දවස රචිත වූවෙකැයි සලකති. ඒ අතර ම ලක්දිව එවකට පැවැති ප්‍රධාන විහාරස්ථාන නාම මාලාව බෞද්ධයකු විසින් දතයුතු බැවින් ද මෙහි එන පරිදි යොදා ඇති වචන කියැවීම පහසු බැවින් ද හෝඩිය ළඟට ම මෙය කියවන දෙවෙනි පොත වශයෙන් භාවිත වූ බව පෙනේ. ඊළඟ තුන්වැනි පාඩම් පොතට ඇත්තේ මඟුල් ලකුණ ය. බුදුරජුන්ගේ අත්පාහි පිහිටි රේඛා පිරික්සන්නවුනට මතුවී පෙණුනු ලකුණු එයින් දැක්විණ. කතෘ සඳහන් නැතත් මේ දෙපොත් ම නරේන්‍ද්‍රසිංහ රාජ සමයට අයත් යැ යි සිතිය හැකිය.

බළන්ගොඩ ආනන්දමෛත්‍රෙය ස්ථවිර

# නම් පොත

නමෝ බුද්ධාය

සගම, පස්ගම, අරත්තන, මාදන්වල, විල්වල, කඩදොර, මොරපාය, දිඹුල, පුසුල්පිටිය, නියම්ගම්පායස්ථානය, වල්වාසගොඩ, සැලව, අරම, මැදිළිය, දික්පිටිය, බම්පනේ, කාරියගම, දඩගමුව, අළුත් නුවර, පරණ නුවර, මාවෙල, මාකඩවර, හිඟුල, කප්පාගොඩ, පදීදොර, උතුරාවල, අම්බුළුගල, දනගිරිගල, වාගිරිගල, ලෙනගල, අලවතුර, වතුර, මාකුරාව, කවුඩුගම, බිසෝවෙල, දැදිගම, අරන්දොර, දොරවක, මඩබඩවිට, තොටගෙදර, මදුරුපිටිය, අත්තනගල්ල, ඌරාවෙල, ගොඩගෙදර, දොරණෑගොඩ, යටවත්ත, රාගම, මීගමුව, දඹදෙණිය, බෙලිගල, නවගමුව, බමුණුගම, වට්ටාරම, වතුදෙණිය, පුහුරිය, ගල්බඩගම, කොල්ලුර, ඔකඳපළ, උඩපළ, අල්ගම, නවකෙළගමුව, ඇත්කඳ විහාරය, කුරුණෑගල, කුරුවෙණියාගල, ආඳාගල, ඉබ්බාගල, යක්දෙස්සාගල, නාථගම, සංවැල්ල, කඩිකාව, මලගණේ, කබල්ලෑලෙන, නියඳවනේ, නාගල විහාරය, රැස්වෙහෙරුව, තලන්ගමුව, පෙරියකඩුව, දේවගිරි විහාරය, සංගමු විහාරය, උතුරුපවු විහාරය, බුජස්ලෙන, යාම්ලෙන, ජයකඩුලෙන, සැඟැලෙන, කුඹුරුලෙන, රිදීලෙන, රම්බඩගල්ල, දෙල්විට, විල්ගම, අස්ගිරිය, රුසීගම, ඇම්බැක්ක, මිලිලවාණය, බඹාවිහාරය, රන්ගිරිදඹුල්ල, සීගිරිය, කලාවැව, බළල්ලෑව, අනුරාධපුරයෙහි ශ්‍රී මහා බෝධීන් වහන්සේ, ලෝවා මහා ප්‍රාසාද ස්ථානය, මිරිසවැටි විහාරය, අභයගිරි විහාරය, දෙනා නබය, හගිරි නබය, රත්නමාලී චෛත්‍යය, ථූපාරාම චෛත්‍යය, මිහින්තලය, අටසැටලෙන, නිතුපත්පාන, සුරුලුමහමුනියාව, මුන්නේස්සරම, ඇත්තල, මක්කම, මන්නාරම, මාන්තෝට්ටම, පොම්පරිප්පුව, මල්විල, දෙමළපට්ටනමෙහි නාගකෝවිල, කඳුරුගොඩ විහාරය, තෙලිපොල, මල්ලාගම, මිණිවන්ගොමු විහාරය, තන්නි දිවයින, අග්නි දිවයින, නාග දිවයින, පුවඟු දිවයින, කාර දිවයින, මොල්ලියාවල, තිරිකුණාමලය, විල්ගම් වෙහෙර, තිස්ස මහ වෙහෙර, ඉලන්දගොඩ, කඳුරුකෝට්ටයෙහි ඇතුබඳය, ලඞ්කාතිලකය, ගඩලාදෙණිය, විජයොත්පාය, අභය ගිරි විහාරය, ජේතවන විහාරය, කපිල විහාරය, ඉසිපතනාරාමය, කුසිනාරාමයේ සිටිපිළිම ගෙය, පූර්වාරාමය, දක්ෂිණාරාමය, පශ්චිමාරාමය, උත්තරාරාමය, සළුමිණිසෑය, සිළුමිණිසෑය, දෙමළ මහ සෑය, පොළොන්නරු විහාරය, සුළුන්නරු විහාරය, සිතුල්පවු විහාරය, ධනංජය විහාරය, කුකුළුවා විහාරය, දඹුලාගල් විහාරය, නකා වෙහෙර, මියුඟුණා වෙහෙර, සොරන්නා තොට, බදුලු වෙහෙර, යුඳඟනා පිටිය, රුහුණුබද කතරගම, උග්ගල් අළුත්නුවර, තඹගමුව, මුල්ගිරිය, ඔවාගිරි විහාරය, දෙව්නුවරෙහි දිව්‍යරාජ භවනය, ඔත්පිළිම ගෙය, ගල්ගණේ, වැලිගම අග්‍රබෝධි විහාරය, පරගොඩ විහාරය, තොටගමු විහාරය, ගලපාත විහාරය, බෝධිමලු විහාරය, වනවාස විහාරය, බෙම්වෙහෙර, බෙම්තොට, කළුතොට, සොරණ, විසිදාගම,

කොතලාවල, රඹුක්කන, පානදුරේ දේවාලය, බෙලන්විල, පැපිළියාන, නාවින්න, විජයාරාමය, සුභද්‍රාරාමය, ජයවර්ධන කෝට්ටයෙහි ඔත්පිළිම ගෙය, ෂන්මුඛ දේවාලය, කිත්සිරිමෙවන් කැළණිය, රජමහ කැළණිය, විභීෂණ දේවාලය, වැලිවිට, බොල්ලෑගල, සංවැල්ල, සේවාගම, දිසාපති නුගය, කඩුදෙවොල, බෝමිරිය, කෙහෙල්බටුවාව, අතුරුගිරි විහාරය, දෙනගමුව, දෙල්ගමුව, බටුගෙදර, දෙනවක, සබරගමුව, ගලීමලය, සමන්තකූට පර්වතය, දිවාගුහාව, බල්ලාහෙල, සිඳගල, කළුගමුව, ගංගාතිලක විහාරය, කුඹල්ඔළුව, අලුදෙණිය, කොටකේදෙණිය, ඉලුපැන්දෙණිය, සේන්දෙණිය, නිග්ගම්මන, අරත්තන, සන්තානාගොඩ, වෙගිරිය, ඇම්බැක්ක, වටදාගෙය, දැලිවෙල, ගඟුල්දෙණිය, උරුලෑදෙණිය, කොටබෝගොඩ, රම්මුංගොඩ, දෙල්දෙණිය, මැණික්දිවෙල, මොනරාගොඩ, කොළුගල, වල්ගම්පාය, දම්තොටවතුර, සියඹලාගොඩ, දොඩම්වල, දියකෙළිනාවල, සූරියගොඩ, කොබ්බෑකඩුව, ගන්නොරුව, කුළුගම්මන, මාගම්මන, අත්තරගම, මැදවෙල, ගල්ලෑල්ල, දොළපීල්ල, අලවතුගොඩ, කොහොන, තිබ්බොටුවාව, ඇඹිල්ල විහාරය, ආලෝක විහාරය, කුරුවාබෝගම්බර, කඩුවෙල, දුනුවිල, ඇඹෙල, නිත්තවෙල, සිරිමල්වත්ත, අමුණුගම, ගංගාරාම විහාරය, සෙංකඩගල, අළුත් විහාරය, පරණ විහාරය, නාගවිමානය, උපෝසථාරාමය, ශ්‍රී දංෂ්ට්‍රා දළදා මන්දිරය ඇතුළු වූ සියලු විහාර දේවාලයවල අධිගෘහිත දෙවි මහරජාණන් තමනුත්, තමන්ගේ සහ පිරිවර දෙවියනුත් සන්දෘෂ්ට සම්භක්ත දෙවියනුත්, උපවෙනෙහි දෙවියනුත්, නොහැර කැඳවාගෙන මඞ්ගල සූත්‍රාදි බණ අසනු පිණිස ඊම සමග මහා සඞ්ඝයා වහන්සේට අභිමත දෝ, අභිමත දෝ, අභිමත දෝ! අභිමතයි, අභිමතයි, අභිමතයි! සමග මහා සඞ්ඝයා වහන්සේ සඟ ව වදාළ මෙහෙවර සඞ්ඝාණත්තිය නුගුළුවා ඉයැ යුතු.

නම්පොත නිමි.

පැරණි අකුරු කරවන පොත් පෙළ - 1

යතුරුලිවීම: හර්ෂණී දේවාදිත්‍ය මහත්මිය
අනුග්‍රහය: අනුරාධ රත්නවීර මහතා (ar-si.blogspot.com)